## සොකරි නාටකය

සොකරි යනු සංස්කෘත චොක්‍රි යන අර්ථයයි. මෙහි සිංහළ අදහස නම් ක්‍රියාව සුන්දරිය යන තේරුම ලැබේ. (එස්. කේ. ජයවර්ධන 1967 අප්‍රේල් කලා සඟරාව) පැරණිම නාටක අතුරින් පැරණිම ජන නාටකයයි.

සොකරි නාටකයේ විශේෂ ලක්ෂණය වන්නේ අනුරූපන මාධ්‍යයෙන් කථාවක් කීමය. කණ්ඩායමේ නායකයා කවියෙන් කරන විස්තරයට නළුවෙක් එය අනුකරණාත්මක නැටුමකින් දක්වයි.

## වර්තමාන තත්වය

පැරණිම සම්ප්‍රදායකින් සොකරි ඉදිරිපත් කරන්නේ ඉතා පිටිසර ගම්මාන වල පමණි. උඩරට හා වන්නි පළාත්වල අස්වනු කපාගත් පසු රංග භූමිය ලෙස කමත සකස් කර සොකරි රඟ දක්වනු ලැබේ. එහෙත් ගෙවල් වල මිදුලේ හෝ ඉඩකඩ ඇති තැනක ද මෙය රඟ දක්වනු දැකිය හැකිය. බොහෝ විට විනෝදාස්වාදයට මුල් තැන දී ඇති බව පෙනේ. පළාතෙන් පළාතට සොකරි රංගනයේ කථා ස්වරූපය මඳ වශයෙන් වෙනස්කම් දක්නට ඇත. සමහර තැනක සොකරි නාටකය ත්‍රිකෝණ ප්‍රේම කථාවක් ලෙස ද, අඹුවක් සොර සැමියෙකු හා පළා යන පුවත්තියක් ලෙස ද සඳහන් වේ. සොකරි කලාත්මක අගයෙන් සපිරුනු රූඟුමකි. එපමණක් නොව ගැමි මට්ටමින් බලන කළ මානසික ශාරීරික අසහන සුව කරන ප්‍රදුම බලයක්, පිළියම් ක්‍රමයක් නාටකය ඇසුරෙන් ගොඩ නැගෙන බව විචාරකයෝ කියති. බොහෝ විට දියුණු රංග ක්‍රම වලට මුල පිරුණේ සොකරි වැනි ජන නාටක ආභාෂයෙන් බව ද සමහරු පවසති. රූඟුමේ හැම ජවනිකාවක් ම ඇදෙන්නේ අත්වැල් ගායනා වලිනි.

## සමාජ විශ්වාසය හා බැඳී ඇති අයුරු

සොකරි කෘෂි කාර්මික ජීවන රටාවක් පසුබිම් කරගෙන කරනු ලබන අභිචාරී ක්‍රමයක් ලෙස හඳුන්වයි. ගොවිතැන් කටයුතු වල දී ඇති වන හානි, සතුන්ගෙන් ඇතිවන උවදුරු නැති කර ගැනීමට හැකිවීම පිළිබඳ දැඩි විශ්වාසයක් සොකරි හා බැඳී පවතී. " සොකරි " පැවැත්වීමට සියළු දෙනාම දායක විය යුතු බව ඔවුන්ගේ විශ්වාසය විය. පත්තිනි දේවිය සහ කතරගම දෙවි ඇදහීමක් ද මෙයින් පෙනේ. ඉරු දෙවි, සඳ දෙවි ගැන ද මෙහි සඳහන් වේ. සොකරි නැටුමේ පූජෝපහාර ලබන පත්තිනි දේවිය මල් පත්තිනි ලෙස හැඳින්වේ.

සොකරි පෙන්වන්න ආරම්භ කළ පසු එය 07 වරක් පෙන්විය යුතු බවට ද ඔවුන්ගේ විශ්වාසයක් විය. එයින් අවසාන සොකරි පූජනීය ස්ථානයක පවත්වනු ලැබේ. බදුල්ලේ සොකරි කණ්ඩායම් දෙකක ප්‍රධානියෝ මේ සිරිත අනුගමනය කරමින් තමන්ගේ අවසාන රංග වාරය බදුලු මුතියංගන රජමහා විහාර භූමියේ රඟ දක්වන්නට බාර වෙති.

අස්වැන්න කපා පාගා ගන්නා අප්‍රේල් මාසයේ තම වැඩ කටයුතු අවසන් කරන ගැමියෝ වෙසක් පොසොන් දක්වාම සොකරි පවත්වති. පිට පිට ම සොකරි හතක් පවත්වන ඔවුහු මඳක් විවේක ලබා නියමිත දින ගණනකට පසු නැවත සොකරි නාටකය සත් වරක් රඟ දැක්වීම සිරිතකි.

සොකරි රඟපාන නළුවෝ උත්සව ආරම්භයේ දීම කතරගම දෙවියන්ට හා පත්තිනි දෙවියන්ට බාර වෙති. උත්සව අවසාවනයේ දී කපුරාළ කෙනෙකුගේ ප්‍රධානත්වයෙන් පත්තිනි පූජාවක් පවත්වයි. මෙහි කෙලවර දැක්වෙන්නේ තිකිණි මස පුර පසළොස්වක දිනයෙහි පෙන්වනු ලබන සොකරි පෙරහැරකි.

බෞද්ධ චාරිත්‍ර වාරිත්‍ර බුද්ධාගම හා සම්බන්ධ කිරීමට එක් සොකරියක් පූජනීය ස්ථානයේ පවත්වනු ලබයි. එමෙන්ම මල් පැල ඉදිරියේ බුදුන් ප්‍රමුඛ දෙවියන්ට මල් පහන් පුදා සොකරිය ආරම්භ කරයි.

## නැටුම් යොදා ගෙන ඇති අයුරු

සෑම කවියක්ම පාහේ මාත්‍රා තුනක් සේ යෙදෙන තාලයට ගායනා කළ හැකිය. නාටකය පුරාම බෙර වාදනය වන්නේ මෙම තාලයට ය. එම තාලයට අනුව නළුවෝ හැම ක්‍රියාවක්ම කරති. ගමන් කිරීම, ගස් කැපීම, යකඩ තැලීම, පන් ඉදිරීම, හාල් ගැරීම, වී පෙළීම, බත් පිසීම, පැදුරු විවීම, නැවේ යාම ආදී ක්‍රියාවන් මෙම තාලයට ම ඉදිරිපත් කරති.

අවස්ථා තීව්‍ර කිරීම සඳහා නැටුම් අංග යොදා ගෙන ඇත. සත්ව රූපයක් ලෙස එන කබර ගොයා ගේ චරිතය මෑත කාලයේ දී එක් කරන ලද කොටසක් යයි හැඟී යතත් එම නිර්මාණය ඉතා සාර්ථක අංගයක් ලෙස සඳහන් කළ හැකිය. සිංහල නාටක වල සත්ව චරිත බොහෝ සඳහන් වේ. පහතරට ශාන්ති කර්ම වල නාග, ගුරුළු, ගොන්, ආදි සත්ව චරිත ඇතත් සොකරියේ මෙන් අවස්ථා තීව්‍ර කිරීමක් මෙයින් සිදු නොවේ. එහෙත් මෙම චරිත හැම සොකරියේ ම නැත. බදුල්ලේ පිං අරාව, කණු පැලැල්ල, බැද්දේගම වැනි ස්ථානවල ඇති සොකරි වල එම සත්ව චරිත නැත. මහනුවර ප්‍රදේශයේ ද සොකරි වල මෙම චරිත ඉදිරිපත් නොවුණි. එහෙත් ලග්ගල, ඉලුක් කුඹුර, ප්‍රදේශයේ පවතින සොකරි වල මෙම අංගය ඉදිරිපත් වූ බව සඳහන් වේ.

### පාත්‍ර වර්ගයා

- ගුරු හාමි
- සොකරි
- පරයා (පච්චමීරා)
- සොත්තානා (සොක්කා)
- කපුවා
- සත්ව චරිත (බල්ලා, කබරගොයා)
- වෙදරාළ

මෙයට වෙනස් පාත්‍ර වර්ගයන් ද සිටින සොකරි ජනප්‍රවාද ඇති බව ද පෙනේ.

සමහර සොකරි වල ඉහත පාත්‍ර වර්ගයන් ට අමතරව ලියන්නෙක් (සොකරි හා ගුරු හාමිගේ විවාහය ලියා පදිංචි කිරීමට) කපුවෙක් (නිමිති බැලීමට) කම්මල් කරුවෙක් (ගස කපන්නට පොරව තනන්න) වඩු රාල - (නැව හැදීමට) කෙනෙක් සඳහන් වේ. කබර ගොයා ද සමහර සොකරියක එන සත්ව චරිතයකි.

සමහර තැනක නක්ෂත්‍ර කරුවෙක් ද සිටියි. කඩවත රකින දෙදෙනෙක් ද රජ කෙනෙක් ද පරිවාර පිරිස ද සමහර සොකරියක ඉදිරිපත් කරයි. බදුල්ල පිං අරාව සොකරි කථාවෙහි හෙට්ටියෙක් ද වෙයි.

## රංග භූමි සැලැස්ම

රංග භූමිය ලෙස ප්‍රධාන තැන කමත වේ. එයට අමතරව ගෙමිදුල හෝ පූජනීය ස්ථානයක මලුව ද රංග භූමිය වශයෙන් ගනී. රංග භූමිය මැද අඹ අත්තක් සිටුවා ඇත. ගෙඩි සහිත අඹ අත්තක්ම තෝරා ගැනීම සිරිතකි. ඒ ළඟට මුතින් තබන ලද වංගෙඩියකි. ඒ මත පොල්තෙල් පහනක් ද දල්වනු ඇත. විදුලි එළිය ප්‍රයෝජනයට ගන්නට පෙර මෙම වංගෙඩිය මත දල්වන ලද මැන්ටල් යෙදූ ලාම්පුවක් ද තබනු ඇත. එදිනට ශුභ දිසාව අනුව මල් පැළක් තනනු ලැබේ. මේ මල් පැළේ බුදුන්ට දෙවියන් ට මල් පහන් ද පොල් ගෙඩියක් පත්තිනි දෙවියන්ට ද තැබීම චාරිත්‍රයකි.
කමත මැද රංගනය පවත්වන අතර ප්‍රේක්ෂකයෝ වටේ සිට නරඹති. වාදකයන් සිටින්නේ අත්වැල් ගායකයන්ට පහසුවෙන් සමීප වන්නට පුලුවන් තැනක හෝ ආසන්නවය. කවිපොත ද එතනම තබාගෙන ගායනා කරනු ලැබේ.

(3)

### වාද්‍ය භාණ්ඩ

උඩරට ප්‍රදේශයේ ගැට බෙරය භාවිතා කරන අතර තාලම් පොට ද ගනු ලබන අවස්ථා ඇත. ඌව ප්‍රදේශයේ බදුල්ල වැනි නගරවල භාවිතා කරනු ලබන්නේ දවුල සමඟ තාලම්පොටය. වත්ති ප්‍රදේශය ... පළාත් වල උඩැක්කිය ද වාද්‍ය භාණ්ඩයක් ලෙස යොදා ගෙන ඇත.

### මෙවලම්

අඹ අත්තක්, (රංග භූමිය අලංකාරයට) වංගෙඩියක්, (ලාම්පුව තැබීමට) මෝල්ගස් දෙකක්, (ක... කිරීමට) පැදුර, (නිදා ගැනීම පෙන්වීමට) මල් යහනාව, (පොල්කෙල් පහන්, හක් ගෙඩි... ගෙඩිය)ආදිය මෙවලම් වශයෙන් භාවිතා කරති. සමහර සොකරි රංගනයේ යෙදෙන නළුවෝ ... හැර) අඩි 2 ක් පමණ දිග රඹුක් ලීයක් අත තබාගෙන රඟති. මෙයට හේතුව වශයෙන් ඔවුන් ... රඹුක් ලීයට යක්ෂ දෝස මග හැරෙන බවයි.

### ඇඳුම් පැළඳුම්

සොකරිය :- සමහර තැනක සාරිය, සමහර විට ඔසරිය අඳී. එක් තැනක දී සොකරිය සෙරෙප්පු ද පැළඳුවාය. එහෙත් සොකරියට අඳින්නේ ද පිරිමියෙකි. කොණ්ඩය බැඳ හෝ නමා දමා මල් පැළඳ ආභරණ යොදා ගනියි.

### ගුරුහාමි

උඩරට ප්‍රදේශයේ ගුරු හාමි උඩරට වෙස් තැට්ටුවාගේ හගල අඳී. හිසට ඔටුන්නක් වැනි උපකරණයකි. බදුල්ල ප්‍රදේශයේ ගුරුහාමි (භාවිතයේ දී සාමිගුරු) සරමක් ඇඳ තව සරමක් උරයක් විවෘතව දමා රැවුලක් ද යොදා ගනියි. හැර මිටියක් අතට ගනියි.

### වෙදරාල

වෙදරාල කෝට් එකක් උඩුකයට අඳී. යට කොටස සරමකින් යුක්තය. පිටට කොට්ටයක් තබා බැඳ කුදු ස්වභාවයක් පෙන්වයි.

### සොක්කානා

බඩ පැත්තට කොට්ටයක් තබා බැඳ ඉදිරියට නෙරාගිය ස්වභාවයක් පෙන්වයි.

උඩරට පළාත් සොකරියේ දී සොකරිත්, ගුරු හාමිත් වෙස් මුහුණු පැළඳ නොසිටි අතර, අනිත් හැම පාත්‍රයාම වෙස් මුහුණු පැළඳ සිටියහ. එම වෙස් මුහුණු පහතරට සම්ප්‍රදායේ වෙස් මුහුණු තරම් දියුණු ලක්ෂණ නැත. කඩදාසිවලින්, පුවක් කොළපත් වලින්, සහ එරබදු ලීයෙන් සකස් කර ගත් සාමාන්‍ය වෙස් මුහුණු බව කියැවේ.

සමහර සොකරි නාටකවල සොකරියන් දෙදෙනෙකුද තවත් වරෙක සොකරිය හා කාලිය වශයෙන් ද (කාලිය සොකරියගේ සේවිකාව ලෙස) රඟන අවස්ථා දක්නට ලැබේ. බදුලු සොකරි කණ්ඩායමේ සොකරිය සහ කාළිය ඔසරි ඇඳ සිටිනු දක්නට ලැබේ.

### නැටුම් අංග

සියලුම පාත්‍ර වර්ගයා එකම තාලයක් අනුගමනය කරමින් වංගෙඩිය වටේ නැටූහ. හැම නැටුමකට ම හාස්‍ය දනවන නර්තන අංග සහ නියමිත කාලයක් විය. නියමිත නැටුම් කොටසක් නොවීය. මහනුවර ප්‍රදේශයේ දී ගුරුහාමි උඩරට නැටුමට අදාලව අඩව් කීපයක් ද කස්තිරමක් ද නටයි.

## භාෂා ව්‍යුහය

කථාව කාව්‍යමය වේ. පච්චම්රාට සමහර විටෙක පරයා වශයෙන් ව්‍යාවහාර වේ. දෙමළ උච්චාරණ දෙබස් යෙදෙන විටෙක හාස්‍ය උපදවන සේ උච්චාරණය කරනු ඇත. පුනරුත් කියුම් කෘතිය පුරාම දක්නට ලැබේ. කඳ ඉරන විට අඳුවන ගැටය හුවා දක්වන්නේ කඳ දෙසට අත තැබීමෙන් නොවේ. පලංචිය මෙන් නැමී සිටින්නා සේ දෙකකුල් අතරින් අත යවා බැලීමෙනි. මී මැස්සා, ඇනීම මෙන්ම මෙතන කැවෝ කියන අවස්ථා කීපයක දී මෙතන යනුවෙන් පසුපස ප්‍රදේශයට ඇඟිල්ලැ දික්කර පෙන්වයි. මේ සියල්ලම හාස්‍යය ඉස්මතු කරන අවස්ථාවන්ය.

## කථා ප්‍රවෘත්තිය

කාසි රටේ ගුරුහාමි සොකරි විවාහ කරගෙන පරයා සමඟ ලංකාවට පැමිණෙයි. කතරගම වන්දනාවේ යන්නට පැමිණෙන මොවුහු කඹරවිට වෙද රාළගේ ගෙදරක, නතර වෙති. බත පිසීමට වතුර ගෙන ඒමට ගුරුහාමි යන අතර බල්ලෙක් සපාකයි. මේ නිසා ලෙඩවෙන ගුරුහාමි ට ප්‍රතිකාර කිරීමට වෙදරාල එයි. බෙහෙත් දී ගුරුහාමි නිදාගත් පසු වෙදරාල සොකරි සමග පලායයි. සුවපත් වුණු ගුරුහාමි සොකරි සොයයි. වෙද රාලගේ ගෙදර සිට හමුවෙයි. පසුව කතරගම ගොස් දරුවකු වඩාගෙන නළවමින් එයි.

## අවසානය

සොකරි නාටකය දැනට ඇති පැරණිම නාටක අතරින් එකකි. සශ්‍රීකත්වය බලපොරොත්තුව මේවා රඟ දක්වන්නට ඇත. ප්‍රාදේශීය නැටුම් සම්ප්‍රදායන්ගෙන් පෝෂණය වී ඇති, හුදු ගැමියාගේ සිතුම් පැතුම් වලින් ගහන වී ඇති, මෙහි හොඳ සමාජමය එකතුවක් වේ. ශාන්තිකර්මයක ලක්ෂණ ද දක්නට ඇත. දේව සංකල්ප මත ගොඩ නැගී ඇති මෙහි හාස්‍ය ජනක වදන් ගැබ් වී තිබේ. ජවනිකා ද හාස්‍යය මුල් කරගෙන පවතී. ග්‍රාම්‍ය වචන වැඩිපුර පවතී. කවි ගායනය ද ඒකාකාරී ය. ඇතැම් තැනක ගද්‍ය සංවාද වෙයි. කෙසේ වෙතත් ගැමි ජනතාව අදත් අගය කරන නාටකයකි, සොකරිය.

පැවරුම:-

- ඉහත සටහන ඔබේ නර්තන විෂය පොතේ සටහන් කරගන්න. අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) සොකරි නාටකය පැවැත්වීමේ අතීත හා වර්තමාන අරමුණු කෙටියෙන් විස්තර කරන්න.

(ii) සොකරි නාටකයේ එන චරිත 04 ක් නම් කරන්න.

(iii) සොකරි නාටකයේ රංග භාණ්ඩ හා රංග වස්ත්‍රාභරණ පිළිබඳ විග්‍රහ කරන්න.

(iv) සොකරි රඟමඩල චිත්‍රයක් අඳින්න.